# විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ කුටුම්භ ආදායම සහ අධ්‍යාපන වියදම අතර සම්බන්ධතාව

කේ.සී.එල්. ප්‍රනාන්දු[1] එම්.එස්. අබේසිංහ[2]
හිමංගා රණසිලිගේ[3] කුෂානි මදුෂානි[4]
ලක්මාලි චතුරිකා[5]

**සංක්ෂේපය**

විවිධ වූ සංස්කෘතීන් සමාජ මට්ටම් සේම වෙනස් වන මාසික ආදායම උපයන කුටුම්භයන් නියෝජනය කරන විද්‍යාර්ථීන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරනු ලබයි. එබැවින් සාමාන්‍ය ජන සමාජයෙන් බැහැරව විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ කුටුම්භයන් ලබන මාසික ආදායමත් අධ්‍යාපනය සඳහා කරනු ලබන වියදමත් අතර පවතින සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම කාලෝචිත වේ. මෙම අධ්‍යයනයේදී විද්‍යාර්ථීන්ගේ කුටුම්භයන්ගේ ආදායමෙන් අධ්‍යාපනය සඳහා වැය කරනු ලබන මුදල් ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් විමර්ශනය කිරීම අරමුණු කරගනු ලබයි. මෙහිදී සරල සසම්භාවී ක්‍රමයට අනුව නියැදිය තෝරාගත් අතර දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන ලදී. සමීක්ෂණයෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කිරීම සඳහා වගු ප්‍රස්තාර සටහන්, විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම, සරල ප්‍රතිපායන හා බහුගුණ ප්‍රතිපායන විශ්ලේෂණ ක්‍රම යොදාගන්නා ලදි. සමීක්ෂණයට අනුව සරල ප්‍රතිපායන ආකෘතියෙහි සමස්ත වෙසෙසියා මට්ටම 0.170 වේ. එහි නිර්ණන සංගුණකය 0.106 වේ. බහුගුණ ප්‍රතිපායනයට අනුව ආකෘතියෙහි සමස්ත වෙසෙසියා අගය 0.0215 ක් හා නිර්ණන සංගුණකය 0.1778 ක් වේ. විශ්වවිද්‍යාලවල විද්‍යාර්ථීන්ගේ මුළු මාසික වියදමත් අධ්‍යාපන වියදමත් අතර සහසම්බන්ධතා අගය 0.32 ක් වේ. මේ අනුව කුටුම්භ ආදායමත් අධ්‍යාපන වියදම් වෙනුවෙන් වැය කරන මුදල් ප්‍රමාණයත් අතර සබඳතාව දුර්වල මට්ටමක පවතින බව නිගමනය කළ හැකිය .

**මුඛ්‍ය පද :** *අධ්‍යාපන වියදම, ආදායම, බහුගුණ ප්‍රතිපායනය*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය,chathurangilakshikashane@gmail.com
[2] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, senali.abeysinghe@yahoo.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, himangaranasilige@yahoo.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, kushani.madushani92@gmail.com
[5] ශාස්ත්‍රවේදී (විශේෂ)ආර්ථික විද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, akmalicha91@gmail.com